# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2496/07 - 2026 ජූලි මස 07 වැනි අඟහරුවාදා - 2026.07.07**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) (අ) වගන්තිය යටතේ**

**කල්පිටිය ප්‍රාදේශීය සභාවේ**

**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කල්පිටිය ප්‍රාදේශීය සභාවේ අංක 06 තලවිල කොට්ඨාසයට තේරී පත්වූ බුලත්සිංහලගේ දොන් මල්ෂා ඇන් සිතුමිණි මෙනවිය අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කල්පිටිය ප්‍රාදේශීය සභාවේ අංක 06 තලවිල කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වීරසින්හ ජයවර්ධන ශානිකා ලක්මාලි මහත්මිය නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කල්පිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි සිරිනිවසගේ ලක්ෂිත රුවන් ජයනායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව, ක්‍රියා කරමින් වීරසින්හ ජයවර්ධන ශානිකා ලක්මාලි මහත්මිය කල්පිටිය ප්‍රාදේශීය සභාවේ අංක 06 තලවිල කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**එස්. එල්. ආර්. ජයනායක,**
තේරීම්භාර නිලධාරි,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2026 ජූලි මස 03 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

EOG 07 - 0075

**(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) (ආ) වගන්තිය යටතේ**
**කල්පිටිය ප්‍රාදේශීය සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කල්පිටිය ප්‍රාදේශීය සභාවට තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ කුරුකුලසූරිය බ්‍රිජෙට් රෝහිණී ප්‍රනාන්දු මහත්මිය අයත් වන්නා වූ සමගි ජන බලවේගය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා මීදෙනියලාගේ සුධර්මා මල්කාන්ති මහත්මිය නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කල්පිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි සිරිනිවසගේ ලක්ෂිත රුවන් ජයනායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාරව, ක්‍රියා කරමින් මීදෙනියලාගේ සුධර්මා මල්කාන්ති මහත්මිය, කල්පිටිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**එස්. එල්. ආර්. ජයනායක,**
තේරීම්භාර නිලධාරි,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2026 ජූලි මස 03 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

EOG 07 - 0076

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.